**ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය - 2021**

**------------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 20201 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති 6යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---------------------------------------------------------------------------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 47 ඡේදය අනුව වත්කම් වසර තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් මාණ්ඩලික විද්‍යාලයේ රු.මිලියන 1,352.15 ක් වටිනා ඉඩම් සහ ගොඩනැගිලි විද්‍යාලය ආරම්භක වර්ෂය වූ 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ප්‍රත්‍යාගණනය කර වර්තමාන වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.<br>එසේම සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද දැනටමත් භාවිතා කරනු ලබන යුධ හමුදාව විසින් විද්‍යාලයට ලබා දී තිබුණු රු.17,450,000 ක් වටිනා වාහන වල ඵලදායී ජීව කාලය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව නැවත ඇස්තමේන්තු කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් ගොඩනැගිලි ඉදිරියේදී ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු සිදු කරන බව හා යුධ හමුදාව විසින් විද්‍යාලයට ලබා දී ඇති රු.17,450,000 වටිනා වාහන කඩිනමින් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරමි. | නියමිත කාල ඉකුත්වීමෙන් පසු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වල නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශ සහ උපදෙස් ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර නව වටිනාකම් හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි අනේවාසික විදේශ ව්‍යවහාර ගිණුමෙන් (NRFC) මිලදී ගත් රු.2,862,176 ක් වටිනා උපකරණ වලට අදාළ රු.572,435 ක ක්ෂය විලම්භිත ආදායමට ඇතුලත් නොවිය යුතු වුවත් එම වටිනාකමද ඇතුළත්ව විලම්භිත ආදායම ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව විද්‍යාලයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් නිරූපණය වී තිබුණි. | 2022 අප්‍රේල් මස ජ නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | විලම්භිත ආදායම නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 සහ 2021 වර්ෂ සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් රු.828,000 ක දළ වෙන් කිරීමක් සිදු කල යුතු වුවත් ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන තුල කිසිදු වෙන් කිරීමක් සිදු කර නොතිබුණි. | විගණන ගාස්තු වලට අදාල ඉන්වොයිස් ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම්ගත කර නොමැති බවත් ඉදිරියේදී ඇස්තමේන්තුගත මුදලක් ගිණුම් තුල වෙන් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගෙවිය යුතු වියදම් සඳහා වෙන් කිරීමක් සිදු කිරීමට කටයුතු කල යුතුය. |

### 1.7 නීතීරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| නීතී,රීති, රෙගුලාසි ආදියට යොමුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1980 අංක 46 දරන සේවා නියුත්තිකයන්ගේ භාර අරමුදල් පනත | සේවකයිනගේ පත්වීම් ස්වභාවයේ පැවති ගැටළුකාරීත්වය නිවැරදි කර ගැනීමෙන් පසු ආරක්ෂක අමාත්‍යාංශය විසින් සේවා නියුක්තික හා සේවා භාරකාර අරමුදලේ සාමාජිකත්වය ලබා දීමට කටයුතු කරන ලෙස කම්කරු දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.කම්කරු අමාත්‍යාංශයේ නිරුදේශය ලද විගස සේවා | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | නියුකුතතයිනගේ භාර අරමුදලේ ලියාපදිංචා කර දායක මුදල් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) මුදල් රෙගුලාසි 396 (ඇ) | චෙක්පත් ඉදිරිපත් කර දින දීර්ඝ කර ගන්නා ලෙස අදාළ පාර්ශවයන් වෙත දන්වා ඇති අතර ප්‍රතිචාර නොමැති බැවින් චෙක්පත් අවලංගු කිරීමට කටයුතු කරමි. | චෙක්පත් ඉදිරිපත් කර දින දීර්ඝ කර ගන්නා ලෙස අදාළ පාර්ශවයන් වෙත දන්වා ඇති අතර ප්‍රතිචාර නොමැති බැවින් චෙක්පත් අවලංගු කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය
-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 28,959,511 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,963,274 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.996,237 ක වර්ධනයක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් වියදම් රු.15,867,111 කින් වැඩිවීමට සාපේක්ෂ විදේශ ශිෂ්‍යාන්ගෙන් ලද ආදායම රු.16,882,235 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය
-------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රු.මිලියන 133 ක් වැයකර ඉදිකරන ලද සිව් මහල් පුස්තකාල සහ විභාග ශාලා<br>ගොඩනැගිල්ලේ ජල කාන්දු වීමේ ගැටළුව නිසා ඉහල මහලේ විදුලි පද්ධතියට හා බිත්ති වලට විශාල හානියක් සිදු වී පවතින අතර ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු කිරීමට 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නොහැකි වී තිබුණි | කොන්ත්‍රාත් සේවාවන් සම්බන්ධයෙන් ICTAD/SBD/02 හි Clause 11.4 (අ) උප වගන්තිය ප්‍රකාරව ගොඩනැගිල්ලේ දෝෂ විද්‍යාලය වෙතින් හෝ ගෙවන පාර්ශවයකින් සිදු කර ඒ සඳහා වැය වන මුදල කොන්ත්‍රාත් සමාගම වෙතින් අයකර ගැනීමට කටයතු කරන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය මගින් උපදෙස් ලැබී ඇත. | ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු කඩිනමින් පිළිසකර කර ගැනීමට කාර්යක්ෂම හා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යෙදවිය යුතු වීම. |

## 3.2 වාහන පද්ධති කළමනාකාරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කුලී පදනම මත වාහනයක් ලබා ගැනීම සඳහා එකම ලිපිගොනුව මගින් 2021 පෙබරවාරි සිට 2021 දෙසැම්බර් දක්වා මාස 10 ක කාලය තුල අවස්ථා හතරකිදී මිල ගණන් කැඳවා වාහන 04 ක් සේවයේ යොදවා තිබුණි.එසේම කුලී පදනම මත වාහන ලබා ගැනීමේදී ලංසු ලේඛණ වල සඳහන් ආකාරයට පටහැනිව වාහන සපයා ඇති අවස්ථා විගණනයේදි නිරීක්ෂණය විය.තවද මෙලෙස සේවයේ යොදවා ඇති වාහන වාහන පහක් පරීක්‍ෂා කිරීමේදි වාහන තුනක් ධාවනය කල යුතු අවම කිලෝ මීටර් ප්‍රමානයෙන් ඉතා සුළු ප්‍රමාණයක් ධාවනය කර තිබුණු අතර අනෙක් වාහන දෙක අවම කිලෝමීටර් ප්‍රමාණය ඉක්මවා ධාවනය කර තිබුණි.ඒ අනුව වාහන භාවිතයේදී සකසුරුවම් කමින් තොරව ධාවනයේ යොදවා ඇති බව නිරීක්ෂණය විය. | වාහන කුලි ගෙවිමේ පදනමට ලබාගැනීමේදී අදාල අනුමැතිය සමග ධාවනය කලයුතු කිලෝමීටර ප්‍රමාණයක් සම්බන්ධව ගිවිසුම්ගත නොවන අතර, විද්‍යාලීය අවශ්‍යතාවය පදනම් කරගෙන වාහන කුලියට ගැනීම සිදු කරනු ලබයි. ඒ අනුව ධාවනය කරනු ලබන කිලෝමීටර ප්‍රමාණය වෙනස් විය හැක. | වත්කම් සකසුරුවමින් යුතුව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |